සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව දකුණු පළාත
கூட்டுறவு அபிவிருத்தி திணைக்களம் தென் மாகாணம்
DEPARTMENT OF CO-OPERATIVE DEVELOPMENT - SOUTHERN PROVINCE
147/3, පෙට්ටිගලවත්ත, ගාල්ල. 147/3, பெட்டிகலவத்தை, காலி. 147/3, Pettigalawatta, Galle

| | | | | | |
|---|---|---|---|---|---|
| කොමසාරිස් / ஆணையாளர் / Commissioner | 091-2235950 | කාර්යාලය / ෆැක්ස් / அலுவலகம் / பேக்ஸ் / Office / Fax | 091-2234380 | විද්‍යුත් තැපෑල / ஈ-மெயில் / E-mail | coopdepartmentsp@gmail. |

මගේ අංකය / எனது இல. / My No. දපස/සමු.සං/සං/12/වි.පොදු ; ඔබේ අංකය / உமது இல. / Your No. ; දිනය / திகதி / Date 2020.06. 08

විගණන උපදෙස් පත්‍රිකාව 02/2020

ගරු සභාපති/ සාමාන්‍යාධිකාරී,
සියළුම විවිධ සේවා සමුපකාර සමිති,
දකුණු පලාත.

**<u>සමුපකාර සමිති වල ගිණුම් කටයුතු යාවත්කාලීන කර ගැනීම කර ගැනීම සඳහා ආයතන පුහුණුව ලබා දීමේ පදනම මත පුහුණුලාභීන් බඳවා ගැනීම.</u>**

1983 අංක 32 හා 1992 අංක 11 දරණ පනත් වලින් සංශෝධිත 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 43 අ (2) වන වගන්තිය ප්‍රකාරව සියළුම සමුපකාර සමිති තම සමිතියේ මුදල් වර්ෂය අවසාන වී මාස 03ක් ඇතුලත අදාල ගිණුම් වාර්ථා විගණනය සඳහා ඉදිරිපත් කල යුතු වේ.

02. ඒ අනුව දකුණු පලාත තුළ පිහිටි විවිධ සේවා සමුපකාර සමිති වල විගණනය යාවත්කාලීන කර ගැනීම සඳහා එම සමිති වල අදාල අවසාන ගිණුම් හා මූල්‍ය ප්‍රකාශණ කඩිනමින් සකස් කර ගැනීම අත්‍යාවශ්‍ය වේ.

03. ඔබ සමිතියේ ගිණුම් සකස් කිරීම යාවත්කාලීනව සිදු වී නොමැති නම් පහත සඳහන් උපදෙස් අනුගමනය කරමින් කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

ඒ සඳහා,

➢ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පාලනය වන ගාලු දිස්ත්‍රික්කයේ ලබුදුව හා තංගල්ල යන නගර වල පිහිටා ඇති උසස් තාක්ෂණ ආයතන යටතේ ගිණුම්කරණය හෝ විගණනය පිළිබඳ පාඨමාලාවක් හදාරන ලද අභ්‍යාසලාභීන් සහ දකුණු පලාත තුළ පිහිටි තාක්ෂණ විද්‍යාල (COT) වල ගිණුම්කරණය පිළිබඳ ඩිප්ලෝමා/ සහතිකපත්‍ර පාඨමාලාවන් හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් ආයතනික පුහුණුව ලබා දීමේ පදනම මත බඳවා ගැනීම.

(අදාල පුහුණු ආයතන වල ලිපින හා දුරකතන අංක ඇතුළත් නාම ලේඛණයක් මේ සමග අමුණා ඇත.)

- පුහුණු කාල සීමාව තුල එකී පුහුණුලාභීන් සම්බන්ධ කර ගනිමින් ගිණුම් කටයුතු යාවත්කාලීන කිරීමට අවශ්‍ය සුදුසු වැඩපිලිවෙලක් සකස් කර ගැනීම.

- ඔවුන්ට සමිතියේ ගණකාධිකාරී අධීක්ෂණය යටතේ ගිණුම්කරණය හා අභ්‍යන්තර විගණනය සම්බන්ධයෙන් පුහුණුවක් ලබා දෙන අතරතුර ගිණුම්කරණය සම්බන්ධ සමිතියේ අඩුපාඩු සකස් කර ගැනීමට පියවර ගැනීම.

ගණකාධිකාරී / கணக்காளர் / Accountant 091-2226554
සහකාර කොමසාරිස් (සංවර්ධන) / துணை ஆணையாளர் (அபிவிருத்தி) / Ass. Commissioner (Dev.)

- ➢ එකී කාල සීමාව තුල පුහුණුලාභීන්ට එක් දිනකට රු.500 ක දීමනාවක් ලබා දීම සුදුසු අතර මාස 06ක උපරිම පුහුණු කාල සීමාවකට යටත්ව පුහුණු ලාභීන් බඳවා ගත යුතුවේ.
- ➢ බඳවා ගනු ලබන පුහුණු ලාභීන්ට පුහුණුව අවසානයේදී පුහුණුව ලැබූ බවට සහතිකයක් ලබා දීමට කටයුතු කිරීම.
- ➢ එකී වැඩපිළිවෙලෙහි ප්‍රගතිය සෑම මාසයකට වරක්වත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සාකච්ඡා කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කර ගැනීම.

03. ඉහත වැඩපිළිවෙල ක්‍රියාත්මක කරලීම සම්බන්ධ ප්‍රගතිය ඔබ දිස්ත්‍රික්කය භාර සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් දැනුවත් කරන ලෙසත් අවශ්‍ය උපදෙස් ලබා ගන්නා ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

ආර්.ජී. කන්නන්ගර,
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
දකුණු පළාත.

පිටපත-
සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (ගාල්ල/මාතර/හම්බන්තොට) - කාරු. දැ.පි හා අ.ක.ස